# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 අප්‍රේල්/ මැයි/ ජූනි**

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝල විද්‍යාව - GEOG- E 3015**

**ප්‍රාදේශීය භූගෝල විද්‍යාව - ශ්‍රී ලංකාව හා දකුණු ආසියාව**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන**
**<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

### 1 වන කොටස

01. ශ්‍රී ලංකා භූ දර්ශනයේ පරිණාමය සම්බන්ධයෙන් විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති මතවාද සැකෙවින් සාකච්ඡා කරන්න.

02. අ) ආයාත අදේශන කර්මාන්ත ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීමට තුඩුදුන් හේතු සාධක මොනවාදැයි දක්වන්න.

ආ) එම කර්මාන්ත දිගුකාලීන වශයෙන් අසාර්ථක වීමට බලපෑ කරුණු මොනවාද යන්න පැහැදිලි කරන්න.

03. අ) ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසුව 'දරිද්‍රතාවය අවම කිරීම' සඳහා, බලයට පත්වූ විවිධ රජයන් මගින් අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද යන්න විස්තර කරන්න.

ආ) එම වැඩසටහන් මගින් අපේක්ෂා කළ ප්‍රතිඵල ලබා තිබේද යන්න නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

04. ''උතුරු නැගෙනහිර ප්‍රදේශවල පැවැති යුදමය වාතාවරණයේ නිමාවත් සමගම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රබෝධයක් හටගෙන ඇත.''මෙම ප්‍රකාශයට එකඟ විය හැකිද යන්න පරීක්ෂා කරන්න.

### 11 වන කොටස

05. 'දකුණු ආසියානු කලාපයේ අනන්‍යතාවය' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න.

06. ඉන්දියානු උප මහාද්වීපයේ කර්මාන්ත අංශයේ වර්ධනය හා සම්බන්ධයෙන් මෑත කාලයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයන් මොනවාද යන්න විස්තර කරන්න.

07. ඉන්දියාවේ ජන සංඛ්‍යා වර්ධනය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු සහ, ජන සංඛ්‍යා වර්ධනය පාලනය කර ගැනීම සඳහා ගන්නා ලද පියවර පිළිබඳ සමාලෝචනයක් කරන්න.

08. ළමා අයිතිවාසිකම්, කාන්තා නිදහස හා සුභසාධනය දකුණු ආසියානු කලාපයේ ත්‍රස්තවාදය මැඩ පැවැත්වීම වැනි කරුණු සම්බන්ධයෙන්, මෙතෙක් පවත්වන ලද සාක් සමුළුවාර වලදී කෙබඳු පියවර ගෙන තිබේද යන්න පෙන්වා දෙන්න.

නැතහොත්

''ඉන්දියාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුලින් මතුවන ගැටළු, බොහෝ සමාජ ආර්ථික ගැටළු වලට බලපා ඇති මූලික හේතුවක් වේ.'' මෙම ප්‍රකාශයට එකඟ විය හැකිද යන්න පරීක්ෂා කරන්න.

**************************